**19-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් නිවහන බලා ආපසු යා යුතු බැවින් ජීවාත්ම අවධානයට පත් විය යුතුව ඇත. එකම එක පරමාත්ම පියාව සිහි කළ විට එය ඔබගේ ගමනාන්තය තීරණය කරනු ඇත.

**ප්‍රශ්නය:** අරුම පුදුම පරමාත්ම පියා විසින් ඔබට එළිදරව් කර ඇති අරුම පුදුම රහස කුමක්ද?

**පිළිතුර:** බාබා කියනවා: දරුවනි, මෙම සදාතනික වූ අවිනාශී නාටකය කල් තබාම තීරණය වූවකි. එහි සෑම කෙනෙකුගේම චරිත කොටස නියම වී ඇත. සිදු වන කිසිම දෙයක් අලුත් දෙයක් නොවෙයි. පරමාත්ම පියා කියනවා: දරුවනි, මට මෙහි කිසිම ශ්‍රේෂ්ඨත්වයක් නොමැත. මමත් නාටකයට බැඳුණු කෙනෙකි. මෙම අරුම පුදුම රහස ඔබලාට කීමෙන් පරමාත්ම පියා තම චරිත කොටසේ වැදගත්කම අඩු කරගෙන වාගේයි.

**ගීතය:** අප මෙතෙක් කල් මඟ බල බලා සිටි දිනය දැන් උදා වෙලා!

ඕම් ශාන්ති. සුමිහිරි ආධ්‍යාත්මික දරුවන් මෙම ගීතය ගායනා කරනවා. නැවතත් වතාවක් අපව නිරෝගී කරවා ධනයෙන් පුරවා පාරිශුද්ධත්වයේ, සාමයේ හා සතුටේ උරුමය උරුම කර දීමට කල්පයකට පසුව පරමාත්ම පියා පැමිණෙන බව ඔය දරුවන් දන්නවා. ඒ බ්‍රහමින්වරුනුත් ආශිර්වාද දෙනවා: ඔබට දීර්ඝායු වේවා. ඔබ ධනයෙන් පිරේවා. දරුවන් රැසක් ලැබේවා. ඔය දරුවන්ට උරුමයක් උරුම වෙනවා. ඉතින් වරමක් පිළිබඳ ගැටළුවක් එහි දී නැහැ. ඔය දරුවන් ඉගෙන ගන්නවා. මීට වසර 5000 කට පෙරදීත් පරමාත්ම පියා ඔබට ඥානය දී ඔබලාව මිනිසුන්ගෙන් දේවතාවරුන් බවට, සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන බවට පත් කළ බව ඔබ දන්නවා. ඉගෙන ගන්නා දරුවන් තමන් ඉගෙන ගන්නේ කුමක්ද, තමන්ගේ ගුරුවරයා කවුද කියා දන්නවා. ඔවුන් එය දැන ගත්තේත් තම තමන් දරණා උත්සාහයේ තරමටයි. අධිරාජ්‍යයක් ස්ථාපනය වෙමින් පවතින බව, දේවතා ධර්මය: ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය වෙමින් පවතින බව තමන් දන්නවායි කියා ඔය දරුවන් කියාවි. මීට පෙර අප ශුද්‍රයනුයි. දැන් අප බ්‍රහමින්වරුන් වී සිටිමු. පසුව දේවතාවරුන් වෙමු. තමන් දැන් අයිති ශුද්‍ර කුලයටයි කියා ලෝකයේ සිටිනා කිසිම කෙනෙක් දන්නේ නැහැ. මෙය ඇත්තක් බව ඔය දරුවන් දන්නවා. පරමාත්ම පියා ඔබට සත්‍යය පවසා සත්‍යයේ දේශය ස්ථාපනය කරනවා. ස්වර්ණමය යුගයේ බොරුව හෝ පාපය නැහැ. අජාමිල් වැනි පව්කාරයින් සිටින්නේ කලි යුගයේයි. දැන් මේ කාලයේ මෙය අන්ත අපායයි. දවසින් දවස ඒ අන්ත අපායේ අන්ත බව පෙනෙන්න පටන් ගනීවි. අද කාලයේ මිනිසුන් කරනා ක්‍රියාවලින්ම ලෝකය දවසින් දවස තමෝප්‍රධාන් වෙමින් පවතින බව ඔබලාට අවබෝධ කර ගත හැකියි. මෙහි ලොකුම සතුරා වන්නේ කාම රාගයයි. කලාතුරකින් කෙනෙකුට තමයි පාරිශුද්ධව සිටිය හැකි වන්නේ. ඒ දින වල ශ්‍රමණ තාපසවරුන්ම පවා කලියුග කාලයේදී වයස අවු. 12 – 13 ගැහැණු ළමුන් දරුවන් බිහි කරාවි කියා කිව්වා. ඒ කාලය දැන් පැමිණ තිබෙනවා. තරුණ වයසේ දරු දැරියන් එන්න එන්නම කිලිටි ක්‍රියා වල නිරත වෙනවා. පරමාත්ම පියා කියනවා: මා පැමිණෙන්නේ සෑම කෙනෙක්ම මුළුමනින්ම තමෝප්‍රධාන් වුණු විටයි. මටත් නාටකයේ චරිත කොටසක් තිබෙනවා. මමත් නාටක බන්ධනයට බැඳිලයි සිටින්නේ. ඔය දරුවන්ට මෙය අලුත් දෙයක් නොවෙයි. පරමාත්ම පියා මේ ලෙසින් පහදා දෙනවා. ඔබ කල්ප චක්‍රය වටා ගොස් නාටකයේ අවසානයට පැමිණෙනවා. දැන් පරමාත්ම පියාව සිහි කළ විට ඔබ තමෝප්‍රධාන් වී සතෝප්‍රධාන් ලෝකයේ පාලකවරුන් වෙනවා. ඔහු එතරම්ම සරලවයි ඔබට පැහැදිලි කරන්නේ. පරමාත්ම පියා තමාගේම චරිත කොටසට එතරම් වැදගත්කමක් දෙන්නේ නැහැ. මේ මගේ චරිත කොටසයි: එය අලුත් දෙයක් නොවෙයි. සෑම වසර 5000 කට වරක්ම මට පැමිණීමට සිදු වෙනවා. මමත් නාටකයට බැඳිලයි සිටින්නේ. එවන් පහසු ස්මරණ වන්දනාවක නිරත වන්නේ කෙසේදැයි කියා මා පැමිණ ඔය දරුවන්ට පෙන්වා දෙනවා. ඔබගේ අවසන් සිතිවිල්ල අවසන් ගමන තීරණය කරාවි කියා කියන්නේ මේ කාලය සම්බන්ධයෙනුයි. අවසන් කාල වකවානුව මෙයයි. පරමාත්ම පියා ඔබට ක්‍රම පෙන්වා දෙනවා: නිරතුරුව මා පමණක්ම සිහි කරන්න. ඔබ සතෝප්‍රධාන් වේවි. තමන් නව ලෝකයේ පාලකවරුන් වන බව ඔය දරුවන්ටම අවබෝධ කර ගත හැකි වේවි. පරමාත්ම පියා නැවත නැවතත් කියන්නේ: මෙය අලුත් දෙයක් නොවෙයි. ජීනිගේ කතාව ඔබට කියා තිබෙනවා: කුමන හෝ වැඩක් කිරීමට දෙන්නැයි කියා තදින්ම කියා සිටි ඔහුට පසුව ඉණිමඟක ඉහළට පහළට යන්න කියා කිව්වා. පරමාත්ම පියා කියනවා: මෙයත් ඉහළට යාමත්

පහළට යාමත් අතර වූ සෙල්ලමකි. අපිරිසිඳු ඔබ පිරිසිඳු වී නැවතත් පිරිසිඳු ඔබ අපිරිසිඳු විය යුතුයි. මෙය අපහසු දෙයක් නොවෙයි. හරිම පහසුයි. නමුත් ඔබ සටන් කරන්නේ කුමකටද? මෙය අවබෝධ කර නොගැනීම නිසා ඔවුන් ග්‍රන්ථ වල යුද්ධයක් ගැන සඳහන් කර තිබෙනවා. ඇත්තටම කියනවා නම් මෙය මායා, රාවනව පරාජය කිරීම සඳහා වුණු ලොකු යුද්ධයකි. තමන් පරමාත්ම පියාව නිතර නිතර සිහිපත් කළත් ඒ සිහිය විටින් විට කැඩෙන බව දරුවන් දැක තිබෙනවා. මායා දැල්ල නිමා දමනවා. මේ හා ගෙතුණු ගුල් බකව්ලි (ලාම්පුවක හැපෙන බළලෙක් පිළිබඳ කතාවක්) කතාන්දරය තිබෙනවා. දරුවන් ජය ලබනවා. ඔවුන් ඉතාමත් හොඳින් වර්ධනය වේවි. නමුත් මායා පැමිණ පහන නිවා දමනවා. දරුවන් කියනවා: බාබා, මායාගේ කුණාටු රැසක් එනවා. දරුවන්ට විවිධාකාර කුණාටු වලට මුහුණ දීමට සිදු වෙනවා. වසර අටක් දහයක් පැරණි මහා ගස් පවා කඩා ඇද හැලෙන තරමේ විශාල කුණාටු හමනවා. දරුවන් මේ ගැන දන්නවා. රෝසරියේ ඉතාමත් හොඳින් ඇමිණී සිටි දරුවන් පවා අද යන්න ගිහින් සිටිනා ආකාරය ගැන ඔවුන් කතා කරනවා. අලියෙක්ව ගිල ගත් කිඹුලෙකුගේ කතාවකුත් තිබෙනවා. ඒ මායාගේ කුණාටුවකි. පරමාත්ම පියා කියනවා: පාප පහ සම්බන්ධයෙන් ඉතාමත් ප්‍රවේසම් වන්න.ස්මරණයේ නිරතව සිටියහොත් ඔබ ශක්තිමත් වේවි. ජීව අවධානයට පත් වන්න. පරමාත්ම පියාගෙන් මෙම දැනමුතුකම් ඔබට ලැබෙන්නේ එක් වරයි. වෙන කිසිම කෙනෙක් ඔබට ජීව අවධානයට පත් වන්නැයි කියා කියන්නේ නැහැ. ස්වර්ණමය යුගයේදීවත් කිසිම කෙනෙක් කියන්නේ නැහැ. ඔබගේ නම, රූපය, දේශය හා කාලය ඔබට මතකයි. දැන් ඔබ නිවහන බලා ආපසු යා යුතුයි කියා මේ කාලයේදී මා ඔබට පහදා දෙනවා. ඔබලා මුලදී සතෝප්‍රධාන්ව සිටියා. සතෝ, රජෝ හා තමෝ මට්ටම් වලදී ඔබ මුළු උපත් 84 ම ගත්තා. එයිනුත් අංක එක බ්‍රහ්මායි. අන් අයට එය උපත් 83 ක් විය හැකියි. නමුත් මොහු මුළු උපත් 84 ම ගන්නවා. මුලින්ම මොහු ශ්‍රී නාරායනුයි. මොහු ගැන යමක් පවසනවා යනු එය සෑම කෙනෙකුටම අදාලයි: තම උපත් ගණනාවක අවසානයේ දී මොහු මෙම ඥානය ගෙන නාරායන වෙනවා. කල්ප වෘක්ෂ ගසෙහි මුලින්ම ඔහු ශ්‍රී නාරායන ලෙසින් පෙන්වා ඇති අතර අවසානයේ බ්‍රහ්ම ලෙසින් පෙන්වා තිබෙනවා. පහළ සිටිනා ඔහු රාජයෝගාව හදාරනවා. ප්‍රජාවගේ පියා වන කෙනාට කිසිම විටෙක පරමාත්ම පියා කියා කියන්න බැහැ. පරමාත්ම පියා කියා කිව හැක්කේ එකම එක කෙනෙකුට පමණයි. මොහුව හඳුන්වන්නේ ප්‍රජාවගේ පියා යන අරුත දෙන ප්‍රජාපිතා නමිනි. මොහු ශාරීරික කෙනෙක් වන අතර ඔහු අශාරීරිකයි. රූපයක් නැහැ. ලෞකික පියෙකුටත් පියා කියා කියන්නාක් සේ මොහුව හඳුන්වන්නේ ප්‍රජාවගේ පියා යන නමිනුයි. ඒ පරමාත්ම පියා වාසය කරන්නේ පරම දාමයේයි. ප්‍රජාවගේ පියා පරම දාමයේ වාසය කරනවායි කියා ඔබ කියන්නේ නැහැ. ඔහු සිටින්නේ මෙම භෞතික ලෝකයේයි. සූක්ෂම ලෝකයේවත් නොවෙයි. මිනිසුන් සිටින්නේ භෞතික ලෝකයේයි. ප්‍රජාවගේ පියාට පරමාත්ම දෙවියන් කියන්න බැහැ. දෙවියන්ට ශාරීරික නමක් තිබෙන්න බැහැ. ඔහු නමක් දෙන භෞතික ශරීරයෙන් පිට සිටින්නෙකුයි. ජීවාත්මයන් එහි සිටිනා විට ඔවුන්ට භෞතික නමක් හෝ රූපයක් නැහැ. කෙසේ වෙතත්, ඔවුන් ජීවාත්ම සත්තාවන් ය. සාදු සන්නාසිවරුන් මේ කිසිවක් දන්නේ නැහැ. ඔවුන් තම ගෙවල් දොරවල් අතහැර දමා යන නමුත් ලෝකයේ පාපයන් සියල්ලම ඔවුන් අත්විඳ තිබෙනවා. කුඩා දරුවන් ඒවා ගැන කිසිවක්ම දන්නේ නැහැ. මෙන්න මේ නිසා තමයි ඔවුන් මහාත්මාවරුන් කියා හඳුන්වන්නේ. පාප පහ ගැන ඔවුන් කිසිම දෙයක් දන්නේ නැහැ. කුඩා දරුවෙක් පාරිශුද්ධයි කියා කියනවා. මේ කාලයේදී කිසිම කෙනෙක් පාරිශුද්ධ ජීවාත්මයක් කියා කියන්න බැහැ. මිනිසුන් කුඩා වයසේ සිට මහළු වියට පත් වුවත් ඔවුන්ව හඳුන්වන්නේ අපිරිසිඳු අය කියායි. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: සෑම කෙනෙක්ටම ඒ ඒ අයට ආවේණික වූ චරිත කොටසක් නාටකයේ පටිගත වී තිබෙනවා. මෙම කල්ප චක්‍රය තුළ ඔබ ශරීර කීපයක් ගත්තා ද ක්‍රියා කීයක් කර තිබෙනවා ද ඒ සියල්ල නැවතත් ඒ ලෙසින් කෙරෙනවා. පළමුවෙන්ම, ඔබ ජීවාත්මය තේරුම් ගත යුතුයි. උපත් 84 ක අවිනාශී චරිත කොටසක් එවන් කුඩා ජීව සත්තාවක් තුළ පටිගත වී තිබෙනවා. මේක තමයි හරිම අරුම පුදුම කරුණ. ජීවාත්මයන් අවිනාශී වන අතර නාටකයක් අවිනාශීයි: එය කල්තබාම තීරණය වූවකි. රය ඇරඹුණේ කවදාදැයි කියා ඔබට අහන්න බැහැ. එය ස්වභාවයයි. ජීවයකගේ ස්වරූපය ගැන හෝ නාටකය නිර්මාණය වී ඇති ආකාරය ගැන කිසිම කෙනෙකුට කිසිම දෙයක් කරන්න බැහැ. මහා සාගරය හෝ අහස් තලයේ අවසානයක් නැත්තාක් සේ මෙයත් අවිනාශී නාටකයකි. එය එතරම්ම අපූරු දෙයකි. බාබා ඉතාම අපූරු කෙනෙක් වනවා සේ ම මෙම ඥානයක් හරිම අපූරුයි. ඔබට මෙම දැනුම දීම වෙන කිසිම කෙනෙකුට කළ නොහැකියි. නළුවන් රැසක් තම තමන්ගේ චරිත කොටස් රඟපාමින් සිටියා. නාටකය ඇරඹුණේ කවදාදැයි කියා ප්‍රශ්නයක් පැන නඟින්න බැහැ. බොහෝ දෙනා අහනවා: ඇයි මේ දෙවියන් සතුටත් දුකත් දෙකම තිබෙන ලෝකයක් නිර්මාණය කළේ. මොනවා වෙලාද? කියලා. කෙසේ වෙතත්, එය සදාතනිකයි. සම්පූර්ණයෙන්ම සියල්ල ශූන්‍ය වී යාමක් වන්නේ නැහැ. එය කල් තබාම තීරණය

වුවක් නිසා ඇයි එහෙම දෙයක් නිර්මාණය වුණේ කියා ඇසිය නොහැකියි. ජීවාත්මය පිළිබඳ දැනුම ඔබට අවබෝධ කර ගත හැකි කාලයේදී පමණයි පරමාත්ම පියා එය ඔබට දෙන්නේ. ඔබ දවසින් දවස දිගටම වර්ධනය වෙනවා. මුලදී බාබා ඔබට පහදා දුන්නේ ඉතාමත් ටිකයි. ඒවා හරිම අපූරුයි. ඔබව ඇද ගැනීමට තරම් එවායේ ලොකු ආකර්ෂණයක් තිබුණා. බතියේත් ලොකු ආකර්ෂණයක් තිබුණා. ග්‍රන්ථ වල කාන්ස් දේශයෙන් ක්‍රිෂ්ණාව අරගත්තා කියා සඳහන් කර තිබෙනවා. කාන්ස් වැනි යක්ෂයින් එහි නොමැති බව ඔබලා දැන් දන්නවා. ගීතාවත්, භගවතයත්, මහාභාරතයත් එකිනෙකට සම්බන්ධයි. නමුත් ඒවායේ ඇති දෙයක් නැහැ. රාවනගේ පඹයෙක් සාදා පුළුස්සන දශේරාව කාලාන්තරයක් තිස්සේ පැවතියක් කියා ඔවුන් විශ්වාස කරනවා. රාවන යනු කුමක්දැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. පහළට බසිනා අතර දේවතාවරුන් ක්‍රම ක්‍රමයෙන් අපිරිසිඳු වීමට පටන් ගත්තා. අපිරිසිඳු වි ඇති නිසා කන්නලව් කළේ ඔවුනුයි. මෙන්න මේ නිසා තමයි ඔවුන් කියන්නේ: අහෝ, පාරිශුද්ධකරුවාණෙනි කියලා. මේ සියල්ල පහදා දෙන්නේ පරමාත්ම පියාම පමණයි. ලෝක චක්‍රයේ මුල, මැද හෝ අග ගැන කිසිම කෙනෙක් දන්නේ නැහැ. මෙසේ වීමෙන් ඔබ ගෝලයේ පාලකවරුන් වෙනවා කියලා ඔබලා දන්නවා. ත්‍රිමූර්තියේ සඳහන් වී තිබෙනවා: මේ ඔබගේ පරමාත්ම දේව ජන්ම අයිතියයි කියලා. බ්‍රහ්ම මගින් ස්ථාපනයත්, ශංකර් හරහා විනාශයත්, විෂ්ණු විසින් පෝෂණයත් කරනා බව සඳහන් වී තිබෙනවා. විනාශයත් අනිවාර්යෙන්ම සිදු විය යුතුයි. නව ලෝකයේ සිටින්නේ ඉතාමත් ටික දෙනයි. දැන් අසංඛ්‍ය වූ ආගම් ගණනාවක් තිබෙනවා. ආදි සනාතන දේවි දේවතා ධර්මය දැන් තවදුරටත් නොපවතින බව ඔවුන් තේරුම් ගෙන සිටිනවා. ඉතින් ඒ ධර්මය අනිවාර්යෙන්ම අවශ්‍යයි. මහාභාරතය ගීතාව හා සම්බන්ධ වූවකි. මෙම කල්ප චක්‍රය දිගටම කැරකෙනවා: එක තත්පරයකටවත් එය නැවතිය නොහැකියි. එය අලුත් දෙයක් නොවෙයි. වාර ගණනාවකදීම ඔබ රාජ්‍යය දිනා ගත්තා. හොඳින්ම සෑහීමකට පත්ව සිටින්නන් ඉතාමත් පරිණතව හා දැඩිව සිටිනවා. තමන් වාර ගණනාවකදීම මෙම රාජ්‍යය දිනා ගෙන ඇති බවත් අවසන් වරට දිනාගත් දිනය ඊයේ දවස වගේයි. ඊයේ දේවතාවරුන් ලෙසින් සිටි අප කල්ප චක්‍රය වටා ගොස් දැන් අපිරිසිඳු වී නැවතත් වතාවක් යෝග බලයෙන් ලෝක ස්වාධිපත්‍යය දිනා ගනිමින් සිටිනවා. පරමාත්ම පියා කියනවා: ඔබ සෑම කල්පයකදී ම ලෝක ස්වාධිපත්‍යය දිනා ගන්නවා. කුඩා හෝ වෙනසක් තිබිය නොහැකියි. ඇතැම් අය පහළ තත්ත්වයක් දිනා ගන්නා අතර අනිත් අය ඉහළ තත්ත්වයක් දිනා ගන්නවා. ඒ ඔබ දැරූ උත්සාහයේ ප්‍රතිඵලයයි. තමන් මීට පෙර සිටියේ වානරයින් වගේයි කියා ඔබලා දන්නවා. පරමාත්ම පියා දැන් ඔබව දේවාලය වැඩ සිටීමට සුදුස්සන් බවට පත් කරවනවා. කිසිම වටිනාකමකින් තොරව සිටි තමන් දැන් පවුමක් තරම් වටිනා අය බවට පත් වෙමින් සිටිනා බව හොඳ දරුවන්ගේ ජීව අවබෝධ කර ගෙන සිටිනවා. සෑම කල්පයකදීම පරමාත්ම පියා අපව පැන්සයකින් පවුමක් තරම් වටිනා අය බවට පත් කරවනවා. පෙර කල්පයේ පටන් සිටිනා අයට පමණයි මේ දේවල් හොඳින්ම අවබෝධ කර ගත හැක්කේ. ප්‍රදර්ශන ආදිය පවත්වන විට එය එතරම්ම ලොකු දෙයක් නොවෙයි. ඔබ අමරණීය දේශය ස්ථාපනය කරන්නේ ඒවා මගිනුයි. භක්ති මාර්ගයේ දෙවඟනන් සඳහා දේවාල රාශියක් තිබෙනවා. ඒ සියල්ල වන්දනාකරුවන් ලෙසින් සිටින්නන්ගේ බොරු ආටෝපයි. වන්දනීය වීමේ කිසිම ආටෝපයක් නැහැ. පරමාත්ම පියා කියනවා: දවසින් දවස මම ඔබට ඉතාමත් ගැඹුරු කරුණු පහදා දෙනවා. ඒ කාලයේ පටන්ම ඔබට කියා දුන් කරුණු රාශියක් තිබෙනවා. ඒවාට මොකද කරන්නේ? නිකම්ම තියෙන්න හරිනවාද? දැන් මේ වන විට බාප්දාදා අලුත් අලුත් කරුණු රැසක් පහදා දෙනවා. ජීවාත්මයක් ඉතාමත් කුඩා තිතක් වන අතර ඒ කුඩා ජීවාත්මය තුළ සම්පූර්ණ චරිත කොටසම පටිගත වී තිබෙනවා. මේ කරුණු ඔබගේ ඒ දිනවල ලියූ සටහන් පොත් වල නැහැ. ඉතින් දැන් පරණ කරුණු වලට මොකද කරන්නේ? අවසානයේ ප්‍රයෝජනවත් වන්නේ ප්‍රතිඵලය පමණයි. පරමාත්ම පියා කියනවා: මම මීට පෙර කල්පයේදීත් ඔබට මේ ආකාරයෙන්ම කරුණු පහදා දුන්නා. ඔබ දිගින් දිගටම ඉගෙන ගන්නවා. ඇතැම් විෂයන් සම්බන්ධයෙන් යම් යම් ගැටළු ඇති වේවි. ව්‍යාපාරයකදී වුවත් අපල කාලයක් උදා වන අවස්ථා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබ අධෛර්යයට පත් විය යුත්තේ නැහැ. නැවතත් දෙපයින් නැගී සිට උත්සාහ දැරිය යුතුයි. ඇතැම් පුද්ගලයින් සම්පූර්ණයෙන්ම බංකොලොත් වී ගියත් නැවතත් සියලු වැඩ කටයුතු අරඹා ඉතාමත් ධනවත් අය බවට පත් වෙනවා. මෙහිදීත් කෙනෙක් පාපයට ඇද වැටුණු විට පරමාත්ම පියා කියන්නේ: ඉතාමත් හොඳින් උත්සාහ දරා ඉහළ තත්ත්වයක් දිනා ගන්න කියලයි. නැවතත් නැගිටීමට පටන් ගත යුතුයි. පරමාත්ම පියා කියනවා: ඔබ ඇද වැටිලා දැන් ආපසු නැගිටිය යුතුයි. බිමටම වැටී නැවතත් නැගිට්ට අය රාශියක් සිටිනවා. බාබා ඔබට එය තහනම් කරන්නේ නැහැ. එවන් ජීව ගණනාවක් පැමිණේවි කියා පියා දන්නවා. ඔහු කියන්නේ: උත්සාහ දරන්න කියලයි. ඔවුනුත් යම් තරමක් හෝ දුරට උදව්කරුවන් වේවි. එකත් නාටක සැලැස්මේ ඇති දෙයක් වේවි. පරමාත්ම පියා කියාවි: හොඳයි දරුව, ඔබ මඬේ එරී

දැහලුවා. දැන් නැවතත් උත්සාහ දරන්න. අසීමිත පියා මෙහෙම කියයි නේද? බාබාව මුණ ගැනීමට බොහෝ අය පැමිණෙනවා. මම ඔවුන්ට කියන්නේ: ඔබ අසීමිත පියාට ඇහුම්කන් දෙන්නේ නැති ද? ඔබ පාරිශුද්ධ වන්නේ නැති ද? පරමාත්ම පියා තමන් ජීවාත්මයක් කියා සලකා ජීවයන්ට කතා කරනවා. එවිට අනිවාර්යෙන්ම ඊ තලය නියම ඉලක්කයට වදිනවා. කාන්තාවකට වුවත් මෙම ඊ තලය හොඳින්ම වැදුණා නම් මම මේ පොරොන්දුව ගන්නවා කියා කියාවි. ඇයගේ සැමියාට එහෙම වෙන එකක් නැහැ. නමුත් ඇය ඉදිරියට යත්ම ඇය ඔහුවත් ඉදිරියටම ගනීවි. තම බිරින්දෑවරුන් මගින් දැනුමට පැමිණි එවන් අය රාශියක් සිටිනවා. ඇය තමයි තමාගේ ගුරු කියා ඒ සෑම කෙනෙක්ම කියාවි. ඒ බ්‍රහමින්වරුන් එකිනෙකාව එකට බන්ධනා විට සැමියා තම දෙවියා බව බිරිඳට කියා දෙනවා. මෙහිදී පියා කියන්නේ: එකම එක පරමාත්ම පියා ඔබගේ සියල්ලම වන බවයි. මගේ කියා සිටින්නේ එකම එක කෙනායි. වෙන කිසිම කෙනෙක් නොමැත. සෑම කෙනෙක්ම ඔහුව සිහි කරාවි. ඔබ ඔහු සමග යෝග විය යුතුයි. මේ ශරීරයවත් මගේ නොවෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. නරක අපල කාලයක් උදා වුණු කිසිම විටෙක නිකම් අධෛර්යයට පත් වී වාඩි වෙන්න එපා. නැවතත් වතාවක් උත්සාහ දරා බාබාව සිහි කර ඉහළ තත්ත්වයක් දිනා ගන්න.
2. මායාගේ කිසිම කුණාටුවකට පහර දිය නොහැකි වන තරමේ ශක්තිමත් තත්ත්වයක් සිහිපත් කිරීම තුළින් ගොඩනගා ගන්න. නිරතුරුවම තමාව පාපයන්ගෙන් ආරක්ෂා කර ගන්න.

**වරදානය:** ඔබ ජීවමාන ප්‍රදීපාගාරයක් වී ඔබගේ සියලු බල වල ආලෝකයෙන් සියලු ජීවාත්මයන්ට මාර්ගය පෙන්වනු ලබත්වා.

ලෝක යහපත සඳහා උත්තරීතර වාසස්ථානයෙන් අවතරණය වූ ජීවාත්මයක් වීමේ අවධානයේ ඔබ නිරන්තරයෙන් රැඳී සිටින්නේ නම්, ඔබ තුළ ඇති සිතිවිලි සහ ඔබ කතා කරන වචන තුළින් ලෝක යහපත ඔවුන් තුළ මුසු කරනු ඇත. එවිට මෙම අවධානය ප්‍රදීපාගාරයක් මෙන් ක්‍රියා කරයි. ප්‍රදීපාගාරයකින් එක් වර්ණයක ආලෝකයක් මතු වනවා සේම, ඒ ආකාරයෙන්ම, ජීවමාන ප්‍රදීපාගාර වලින් ලැබෙන සියලු බල වල ආලෝකය සියලු ජීවාත්මයන්ට මාර්ගයේ සෑම පියවරක්ම පෙන්වීමට දිගටම ක්‍රියා කරනු ඇත.

**පාඨය:** සෙනෙහස සහ සහයෝගය මෙන්ම, බලයේ ප්‍රතිමූර්තියක් ද වන්න, එවිට ඔබ රාජධානියේ ඉදිරි අංකයක් හිමි කරගනු ඇත.

***** ඔම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

ක්‍රියා කිරීම ස්වාභාවික වනවා සේම, කර්මතීත් වීම ස්වාභාවික වීමට ඉඩ දෙන්න. ක්‍රියා කරන අතර ස්මරණයේ රැඳී සිටින්න. නිරන්තරයෙන් කර්ම යෝගී අවධියේ රැඳී සිටින අයට පහසුවෙන් කර්මතීත් බවට පත්විය හැකිය. ඔබට අවශ්‍ය විට ක්‍රියා කිරීමට පටන් ගෙන, අවශ්‍ය විට වෙන් වන්න. මෙය නිතරම පුහුණු වන්න.